11-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබගේ වගකීම වන්නේ සියලුම දෙනාට සදා සාමය සහ සතුට වෙතට මාවත පෙන්වීමයි. සාමයෙන් රැඳී සිට, සියලු දෙනාට සාමය දන් දෙන්න.

**ප්‍රශ්නය:** ඔබට අසීමිත බුද්ධියක් තිබිය යුත්තේ කුමන ගැඹුරු රහස වටහා ගැනීමටද?

**පිළිතුර:** නාටකයේ ජවනිකා, ඒවා සිදුවීමට නියමිත කාලයන්හිදී රඟදැක්වෙයි. නාටකයට නිවැරදි ආයු කාලයක් තිබේ. පරම පියා පැමිණෙන්නේද, ඔහුගේ නිවැරදි වෙලාවේය; මෙහි තත්පරයක හෝ වෙනසක් තිබිය නොහැක. පරම පියා පැමිණ, මෙම කෙනා තුළට ඇතුළු වන්නේ, හරියටම වසර 5000 කට පසුවයි. මෙම ගැඹුරු රහස වටහාගැනීමට ඔබට අසීමිත බුද්ධියක් අවශ්‍ය වෙයි.

**ගීතය:** මුළු ලොවම වෙනස් වුවත්, අප කිසිදා වෙනස් නොවන්නෙමු.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙතැන අසුන් ගෙන ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරයි. ඔහු ඔය දරුවන්ට සාම දේශයට සහ සතුටු දේශයට මාවත පෙන්වයි. මෙකල සියලු මනුෂ්‍යයින්ට ලෝක සාමය අවශ්‍ය වී ඇත. සෑම කෙනෙකුටම තනි තනිවම මෙන්ම ලෝක සාමයද අවශ්‍යයි. සෑම කෙනෙක්ම පවසන්නේ 'මට සිතේ සාමය ඕනේ', නමුත් ඔවුන්ට එය ලබා ගත හැක්කේ කොහෙන්ද? ඔබට සාමයේ සාගරය වන ඔබගේ පරම පියාගෙන් ඔබගේ උරුමය ලබාගත හැක. අපට එය තනි තනිවම ලැබෙන අතර තොග පිටින්ද, එනම් සෑම කෙනෙකුටමත් එය ලබා ගත හැක. ඉගෙන ගන්නා දරුවන් උත්සාහ දරන්නේ, ඔවුන්ගේ සතුටේ උරුමය තමන්ට ලබා ගැනීමට මෙන්ම, තවද ඔවුන් අන් අයටද මාවත පෙන්වන බව, ඔවුන්ට වටහා ගැනීමට පුළුවන. ඔවුන් තම උරුමය හිමි කරගැනීමට පැමිණියත් නැතත්, අනිවාර්යෙන්ම ලෝකයේ සාමය ඇතිවෙයි. ඔය දරුවන්ගේ වගකීම වන්නේ සියලුම දරුවන්ට සාමය ලබා දීමය. ඔබ මෙසේ නොසිතිය යුතුයි දෙදෙනෙක් හෝ සතර දෙනෙක් පමණක් මෙය ලබා ගන්නේ නම් එහි ඇති ප්‍රයෝජනය කුමක්ද? සමහරුන්ට මාවත පෙන්වා දෙනු ලබන නමුත්, ඔවුන් තුළ විශ්වාසය නොමැති බැවින්, ඔවුන්ට අන් අයව ඔවුන් හා සමාන බවට පත් කරවිය නොහැක. බාබාගෙන් ඔවුන්ට ආශිර්වාද ලැබෙන බව, බුද්ධිය තුළ විශ්වාසය ඇති අයට වැටහෙයි. මේ අන්දමේ ආශිර්වාද දෙනු ලබයි ඔබට දීර්ඝායු ලැබේවා! ඔබ ධනවත් වේවා! එය කීමෙන් පමණක් ඔබට ආශිර්වාද ලැබෙන්නේ නැත. ඔවුන් ආශිර්වාද ඉල්ලන්නේ නම්, ඔවුන්ට මෙසේ පහදා දෙනු ලබනවා ඔබට සාමය අවශ්‍ය නම්, මේ අන්දමින් උත්සාහ දරන්න. උත්සාහ දැරීමෙන් ඔබට ඕනෑම දෙයක් ලබාගත හැක. භක්ති මාර්ගයේදී ඔවුන්ට බොහෝ ආශිර්වාද ලැබෙයි. ඔවුන් සෑම කෙනෙකුගෙන්ම ආශිර්වාද ඉල්ලයි - ඔවුන්ගේ මව, පියා, ගුරුවරයා, ගුරු ආදීන්ගෙන් - සාමයෙන් සහ සතුටින් සිටීමට. කෙසේවෙතත්, මනුෂ්‍යයින් බොහෝ සේ සිටින බැවින් ඔවුන්ට එසේ සිටීමට නොහැක. එසේ නම්, ඔවුන්ට සතුට සහ සාමය ලැබෙන්නේ කෙසේද? ඔවුන් මෙසේ පවා ගායනා කරති අහෝ සාමය පිරිනමන්නා. බුද්ධිය තුළට ඇතුළු වන්නේ අහෝ පරම පියාණෙනි, පරමාත්ම ජීවයනි, අපට සාමය දන් දෙන්න. ඇත්ත වශයෙන්ම දානයක් යනු, අහුලාගෙන යමෙකුට දිය හැකි දෙයක්. මෙසේ කියමනකි මේවා ඔබගේ දානයයි, ඔබගේ තිළිණයයි. පරම පියා පවසන්නේ කෙනෙක් කෙතරම් ධනය, මුදල්, ගොඩනැගිලි, ඇඳුම් ආදිය දන් දුන්නද, එම දාන සහ පුණ්‍යකර්ම තාවකාලික කාලයකට පමණයි. මනුෂ්‍යයින්, මනුෂ්‍යයින්ට දන් දෙති. ධනවත් අය, දුප්පතුන්ට දන් දෙයි ධනවතුන්, ධනවතුන්ටද දන් දෙති. කෙසේවෙතත්, මෙහිදී ඔබට සදාකාලික සාමය සහ සතුට තිබෙයි. මෙහි කිසිම කෙනෙකුට එක් උපතකටවත් සතුට හෝ සාමය ලබා දිය නොහැක, මන්ද, කිසිම කෙනෙකුට තමන්ටවත් එය නොමැති බැවින්. එය ලබා දෙන්නේ ඒකායන පියා පමණයි. ඔහුට සතුටෙහි, සාමයේ සහ පාරිශුද්ධත්වයේ මහා සාගරය යැයි කියයි. උසස්ම-උසස් පියාගේ ප්‍රශංසාව පමණයි ගැයෙන්නේ. ඔහුගෙන් පමණක් සාමය ලබාගත හැකි බව ඔවුන් විශ්වාස කරයි. ඔවුන් එම පූජකයන් සහ පැවිද්දන් වෙතට යන්නේ, එය භක්ති මාර්ගය බැවිනි. ඉතින්, ඔවුන් දිගින් දිගටම වට රවුමේ යයි. ඒ සියලුම උත්සාහයන් තාවකාලික දේකට පමණයි. ඔය දරුවන් ඒ සියල්ල කිරීම නවතා ඇත. ඔබ මෙසේද ලියයි ඔබට සියයට සියයක සතුට, සාමය සහ පාරිශුද්ධත්වයේ උරුමය, අසීමිත පියාගෙන් හිමි කරගත හැක. දැන් මෙහි සියයට සියයක අපවිත්‍රභාවය, දුක සහ අසහනය තිබෙන නමුත්, මනුෂ්‍යයින්ට මෙය වැටහෙන්නේ නැත. ඔවුන් පවසන්නේ ඍෂිවරු, මුනිවරු ආදීන් පිවිතුරු බව කියාය, නමුත් නිර්මාණය තවමත් සිදුවන්නේ විෂ තුළින් නොවෙයිද?

ප්‍රධානතම දෙය මෙයයි. රාවනගේ රාජධානියේ පාරිශුද්ධත්වය පැවතිය නොහැක. පාරිශුද්ධත්වයේ, සතුටේ සහ සාමයේ මහා සාගරය වන්නේ ඒකායන පියා පමණයි. උපත් 21 කට, එනම් චක්‍රයෙන් භාගයක්, වසර 2500 ක් අපට අපගේ උරුමය, ශිව බාබාගෙන් ලැබෙයි. මෙය සහතිකයි. චක්‍රයෙන් භාගයක් එය සතුටෙහි දේශය වන අතර, ඉතිරි භාගයේදී එය දුක් දේශයයි. ලෝකයට කොටස් දෙකකි එකක් අළුත් වන අතර අනෙක පැරණිය. කෙසේවෙතත්, එය අළුත් වන්නේ කවදාද, පැරණි වන්නේ කවදාද කියා කිසි කෙනෙක් නොදනී. වෘක්ෂයේ ආයුෂ නිවැරදිව කිසිම කෙනෙකුට කිව නොහැක. ඔබ දැන් මෙම වෘක්ෂය ගැන පරම පියාගෙන් ඉගෙනගෙන ඇත. මෙම වෘක්ෂය වසර 5000 ක් පැරණිය. එහි නිවැරදි වයස දන්නේ ඔබ පමණයි. වෙනත් වෘක්ෂයන්ගේ වයස වෙන කිසි කෙනෙක් නොදනි. ඔවුන්ට දිය හැක්කේ තක්සේරුවක් පමණයි. කුණාටු පැමිණ, ගස් වැටී, ඒවායේ ආයුෂ අවසන් වෙයි. මනුෂ්‍යයින්ද හදිසියේ මිය යයි. මෙම අසීමිත වෘක්ෂයේ වයස හරියටම වසර 5000 කි. මීට වඩා දවසක්වත් අඩු හෝ වැඩි විය නොහැක. මෙම වෘක්ෂය පෙර නියම වූවක්. එහි වෙනසක් විය නොහැක. නාටකයේ පැමිණෙන ජවනිකා, ඒවා පැමිණෙන්නට නියමිත වේලාවේදී පැමිණෙයි. නාටකය, කිසිම වෙනසක් නොමැතිව, ඒ අන්දමින්ම නැවතත් සිදු විය යුතුයි. එහි වයසද නිවැරදිය. නව ලෝකය ස්ථාපිත කිරීමට, පරම පියා පැමිණිය යුතුයි. ඔහු පැමිණෙන්නේද නිවැරදි වෙලාවිදීය. මෙහි, තත්පරයකවත් වෙනසක් සිදු විය නොහැක. ඔබගේ බුද්ධි දැන් අසීමිතයි. හරියටම වසර 5000 කට පසුව, පරම පියා පැමිණ, මෙම සිරුර තුළට ඇතුළු වන බව වැටහෙන්නේ ඔබට පමණයි. මේ නිසයි 'ශිව රාත්‍රිය' යැයි කියන්නේ. ක්‍රිෂ්ණාට ඔවුන් කියන්නේ 'ජන්මාෂ්ටමි' කියාය. 'ශිවා ගේ උපන් දිනය' කියා ඔවුන් කියන්නේ නැත. ඔවුන් කියන්නේ, 'ශිවා ගේ රාත්‍රිය' කියාය. එයට හේතුව වන්නේ, උපතක් තිබේ නම්, මරණයක්ද තිබිය යුතු නිසාය. 'උපන් දිනය' කියා පවසන්නේ, මනුෂ්‍යයින්ටය. ශිවා වෙනුවෙන් සැම විටෙකම පැවසෙන්නේ 'ශිව රාත්‍රිය' කියාය. මෙම දේවල් ගැන ලෝකයේ කිසිම කෙනෙක් නොදනී. ඔවුන් එයට ජන්මාශ්ටමි නොකියා, එයට ශිව රාත්‍රිය යැයි කියන්නේ මන්ද කියා, ඔබට වැටහෙයි. ඔහුගේ උපන්දිනය, දිව්‍යමය මෙන්ම අසහායයි. එවන් උපතක් වෙනත් කිසිම කෙනෙකුට තිබිය නොහැක. ශිව බාබා පැමිණෙන්නේ කෙසේද සහ කවදාදා කියා, කිසිවෙකු නොදනී. ශිව රාත්‍රියෙහි අරුත දන්නේ ඔබ පමණයි. මෙය අසීමිත රාත්‍රියයි. භක්තියේ රාත්‍රිය අවසන් වූ විට, දිවාකල ඇතිවෙයි. බ්‍රහ්මාගේ රාත්‍රිය සහ බ්‍රහ්මාගේ දිවාකල, බ්‍රහ්මණයින්ගේද වෙයි. මෙය බ්‍රහ්මා පමණක් පිළිබඳ නාටකයක් නොවෙයි. දිවා කල දැන් ආරම්භ වීමට යන බව ඔබ දන්නවා. ඉගෙන ගැනීමෙන් පසුව, ඔබ ඔබගේ නිවසට ලඟා වෙයි. ඉන්පසුව ඔබ දිවා කලට පැමිණෙයි. මෙසේ කියැවෙයි චක්‍රයෙන් භාගයක් දිවාකල තිබෙන අතර, ඉතිරි භාගයේදී රාත්‍රිය තිබෙයි. කෙසේවෙතත්, මෙය කිසිම කෙනෙකුගේ බුද්ධිය තුළට ඇතුළු නොවෙයි. ඒ මිනිසුන් කියන්නේ, කලි යුගයේ තව වසර 40,000 ක් ඉතිරිව තිබෙන බව සහ ස්වර්ණමය යුගය වසර 100,000 බවයි. එසේ නම්, භාග දෙකක් පිළිබඳ ගණනයක් තිබිය නොහැක. කිසිම කෙනෙක් චක්‍රයේ කාල වකවානුව ගැන නොදනි. ඔබ මුළු ලෝකයේම ආරම්භය, මැද සහ අවසානය පිළිබඳව දන්නවා. වසර 5000 කට පසුව, ලෝකය තවත් චක්‍රයක් හරහා යයි. එසේ වුවත්, එය එම ලෝකයමයි. මනුෂ්‍යයින් ඔවුන්ගේ චරිත කොටස් එහි රඟපෑමෙන් වෙහෙසට පත්වෙයි මෙම යෑම සහ ඒම යන සියල්ල කුමක්ද? උපත් මිලියන 8.4 ක පැමිණීම සහ පිටත්වීම සිදුවන්නේ නම්, කුමක් වෙයිද කියා කවුද දන්නේ? අවිද්‍යාව නිසා, ඔවුන් චක්‍රයේ කාල පරාසය දික් කර ඇත. ඔය දරුවන් දැන් පෞද්ගලිකවම පරම පියා සමඟ ඉගෙනගන්නවා. ඔබ ඔහු ඉදිරියේ ප්‍රායෝගිකව අසුන්ගෙන සිටින බව, ඔබට දැනෙයි. උසස් සංගම යුගය අනිවාර්යෙන්ම පැමිණිය යුතුයි. එය පැමිණෙන්නේ කවදාද, කෙසේද කියා දන්නේ ඔය දරුවන් හැර වෙනත් කිසිවෙකු නොවෙයි එබැවින් ඔය දරුවන් සතුටින් පිනා යා යුතුයි. චක්‍රයෙන් චක්‍රයට පරම පියාගෙන් රාජධානිය හිමි කරගන්නේ ඔය දරුවන්ය. වෙනත් වචන වලින් කියතොත්, ඔබ මායාව ජයගෙන ඉන්පසුව ඔබ පරාජය වෙයි. අසීමිත පරාජය සහ ජයග්‍රහණය මෙයයි. ඒ රජවරුන්ට බොහෝ පරාජය වීම් සහ ජයග්‍රහණයන් තිබේ. බොහෝ යුද්ධ ඇතිවෙයි. ඔවුන් කුඩා යුද්ධයක් ජයගත් විට, ඔවුන්ට මෙසේ කිව හැක අප ජයගත්තා. ඔවුන් ජයගන්නේ කුමක්ද? ඔවුන් කුඩා ඉඩම් කැබැල්ලක් පමණක් ජයගනී. ඔවුන් විශාල යුද්ධයකින් පරාජය වූ විට, ධජය පහතට හෙලයි. පළමුව සිටින්නේ එක් රජ කෙනෙකි. පසුව ව්‍යාප්තිය සිදුවෙයි. පළමුව ලක්ෂ්මි සහ නාරායන්ගේ රාජධානිය තිබේ. පසුව වෙනත් රජවරුන් පැමිණෙන්නට පටන් ගනී. පළමුව එක් පාප්වහන්සේ කෙනෙක් පමණක් සිට, පසුව අංක පිළිවෙලට, බොහෝ පාප්වහන්සේවරුන් පැමිණි ආකාරය ඔවුන් පෙන්වන්නාක් මෙනි. ඕනෑම කෙනෙකුට මරණය කවදා පැමිණෙන්නේද කියා සහතික කළ නොහැක. බාබා අපව අමරණීය කරවන බව, ඔය දරුවන් දන්නවා. ඔහු අපව අමරණීය දේශයේ අධිපතියන් බවට පත් කරවනවා. බොහෝ සෙයින් සතුට තිබිය යුතුයි. මෙය මරණයේ දේශය වන අතර, එය අමරණීය දේශයයි. කිසිම අළුත් කෙනෙකුට මෙම දේවල් වටහා ගැනීමට

නොහැක. පැරණි අය තරම්, මෙම දේවල් වලින් ඔවුන් විනෝදයක් ලබන්නේ නැත. දවසින් දවස වර්ධනය සිදුවනවා. විශ්වාසය ස්ථිර වනවා. බොහෝ දේ දරාගත යුතුයි. මෙය රකුසු ලෝකයකි. දුක් ගෙන දෙන්න ඔවුන්ට වැඩි වෙලාවක් ගත වෙන්නේ නැහැ. ඔය ජීවාත්ම පවසන්නේ අපි දැන් බාබාගේ ශ්‍රීමත් අනුගමනය කරනවා. අප සංගම යුගයේ සිටින අතර, අන් සෑම කෙනෙක්ම සිටින්නේ කලි යුගයේය. සියල්ලන්ටම වඩා ශ්‍රේෂ්ඨ අය බවට අප පත්වෙමින් සිටිනවා. මෙම ඉගෙනුම තුළින් අපි ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයන් බවට පත් වනවා. කෙනෙක් අග විනිසුරු ආදිය වන්නේ ඉගෙන ගැනීමෙනි. ඔබට උගන්වන්නේ පරම පියාය. මෙම ඉගෙනුම තුළින්, ඔබ දරණ උත්සාහයට අනුව, ඔබ තත්ත්වයක් හිමිකරගනී. කෙනෙක් ශ්‍රේණි ගත කරන්නේ, ඔහු හෝ ඇය ඉගෙන ගන්නා ප්‍රමාණයට අනුවයි. මෙහි රාජධානියක් හිමිකරගැනීමේ ශ්‍රේණිගත කිරීමක් තිබේ. එම ඉගෙනුමෙහි, රාජධානියකට ශ්‍රේණිගත කිරීමක් නොමැත. ඔබ රජවරුන්ගෙත් රජවරුන් වන බව ඔබ දන්නවා. එබැවින් ඔබගේ අභ්‍යන්තරයේ බොහෝ සෙයින් සතුට තිබිය යුතුයි. අප ඉතාමත්ම ශ්‍රේෂ්ඨ සහ ද්විත්ව කිරුළු පළන් අය බවට පත් වනවා. පරමාත්ම දෙවියන්, පරම පියාණන් අපට උගන්වනවා. අශරීරික පියා පැමිණ, උගන්වන අන්දම ගැන කිසිම කෙනෙකුට වැටහෙන්නේ නැත. මනුෂ්‍යයින් කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පිවිතුරු කරන්න! නමුත් ඔවුන් පිවිතුරු වන්නේ නැත. පරම පියා පවසන්නේ විශාලතම සතුරා වන්නේ රාගයයි. එක අතකින් ඔබ මෙසේ කන්නලව් කරයි අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණෙන්න! මා දැන් පැමිණ මෙසේ පවසනවා දරුවනි, අපවිත්‍ර වීම නතර කරන්න. ඉතින්, ඔබ අපවිත්‍ර වීම නතර නොකරන්නේ ඇයි? පරම පියා ඔබව පිවිතුරු කරවන නමුත් ඔබ දිගින් දිගටම අපවිත්‍ර වීම සිදු නොවිය යුතුයි. මේ අන්දමින් බොහෝ දෙනෙක් අපවිත්‍ර වෙයි. ඇතැම් අය සත්‍යය පවසයි බාබා, මා මෙම වරද සිදුකළා. බාබා පවසන්නේ ඔබ ඕනෑම පාපකර්මයක් සිදුකර තිබේ නම්, එසැනින් බාබාට කියන්න. සමහරුන් සත්‍යය පවසන අතර සමහරුන් බොරු කියයි. කෙසේනමුත්, විමසන්නේ කවුද? මා මෙතැන අසුන්ගෙන ඔබ එක් එක් කෙනාගේ අභ්‍යන්තරයේ සිදුවන දේ ගැන සොයා බලන්නේ නැහැ. එය කළ නොහැක්කක්. මා පැමිණෙන්නේ උපදෙස් දීමට පමණයි. ඔබ පිවිතුරු නොවන්නේ නම්, පාඩුව ඔබේය. පිවිතුරු වීමට උත්සාහ දැරීමෙන් පසුව, ඔබ අපවිත්‍ර වන්නේ නම්, ඔබ උපයාගත් ආදායම විනාශ වී යයි. ඔබ අපවිත්‍ර වීම ගැන ලැජ්ජාවට පත්වෙයි. එය එසේ නම්, ඔබ අන් අයට පිවිතුරු වන්නට කියා කියන්නේ කෙසේද? ඔබ කෙතරම් නියෝග වලට අකීකරු වුණාද කියා, ඇතුලාන්තයෙන් ඔබගේ යටි සිත ඔබට වද දෙනු ඇත. මෙහිදී ඔබ පරම පියාට සෘජු පොරොන්දුවක් වෙයි. බාබා අපව සතුටු දේශයේ සහ සාම දේශයේ අධිපතියන් බවට පත් කරවන බව ඔබ දන්නවා. ඔහු පැමිණ ඔබ ඉදිරියේ පෙනී සිටියි. අප පෞද්ගලිකවම ඔහු ඉදිරියේ අසුන්ගෙන සිටිනවා. මෙම කෙනාට මින් පෙර මෙම ඥානය නොතිබුණු අතර, ඔහුට එය ගුරු කෙනෙකුගෙන් ලැබුණේද නැත. ඔහුට ගුරු කෙනෙක් සිටියේ නම්, එම ගුරු, එක් අයෙකුට පමණක් දැනුම ලබා දෙයිද? ගුරුන්ට බොහෝ අනුගාමිකයන් සිටියි එක් අයෙක් පමණක් නොවෙයි. මෙම දේවල් වටහාගත යුතුයි. එක් සත්ගුරු කෙනෙක් පමණක් සිටින අතර, ඔහු අපට මාර්ගය පෙන්වයි. අප ඉන්පසුව, එය වෙනත් අයට පෙන්වන්නෙමු. ඔබ සෑම කෙනෙකුටම පරම පියාව සිහිපත් කරන්නට කියා පවසයි, එපමණයි. උසස්ම-උසස් කෙනා වන පරම පියාව සිහිපත් කිරීමෙන් ඔබ උසස් තත්ත්වයක් හිමි කර ගනී. ඔබ රජවරුන්ගෙත් රජවරුන් බවට පත් වනවා. ඔබට අප්‍රමාණ ධනය තිබෙයි. ඔබ ඔබගේ ඒප්‍රන පුරවාගන්නවා නොවේද? බාබා අපගේ ඒප්‍රන බොහෝ සේ පුරවන බව ඔබ දන්නවා. කුබර්ට බොහෝ ධනය තිබුණු බව පැවසෙයි. ඇත්ත වශයෙන්ම ඔබ සෑම කෙනෙක්ම කුබර්ය. ඔබට දිව්‍ය ලෝකයේ ස්වරූපයෙන් සම්පත් ලැබෙයි. මීතුරා වන පරමාත්ම දෙවියන් ගැන කතාපුවතක් තිබේ. ඔහුට මුලින්ම මුණගැසුණු කෙනාට ඔහු එක් දිනකට රාජ්‍යය දුන්නේය. මේ සියලුම දේවල් නිදසුන්ය. අල්ලා යනු පරම පියාය. පළමුවන ආගමේ නිර්මාතෘවරයා ඔහුයි. ඔබට දර්ශන ලැබී තිබේ. යෝගා බලයෙන් ඔබ සැබවින්ම ලෝක රාජධානිය හිමි කරගන්නා බව ඔබ දන්නවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. මෙම රකුසු ලෝකයේ ඔබ බොහෝ සේ දරාගත යුතුයි. යම් කෙනෙක් ඔබට අපහාස කළත්, ඔබව දුකට පත් කළත්, ඔබ එය දරාගත යුතුයි. පරම පියාගේ ශ්‍රීමත් පිළිපැදීම කිසිම දාක නතර නොකරන්න.

2. පිවිතුරු වන්නට කියා, පරම පියා ඔබට සෘජු නියෝගයක් දී තිබේ. එබැවින් කිසිදු විටෙක අපවිත්‍ර නොවන්න. ඔබ පාපයක් සිදුකරන්නේ නම්, එය කිසි විටෙක නොසඟවන්න.

**වරදානය:** **ඒ**කායන කෙනාට අයිති වීමේ සහ අරපිරිමැස්මේ පාඩම ඉගෙන ගැනීමෙන් ඔබ ඕනෑම කැලඹිල්ලකදි නොසැලී අචලව සිටිත්වා.

කාලයට අනුව, සෑම තැනකම අසාමයේ සහ කැලඹිල්ලේ වාතාවරණය වැඩි වෙනවා. එවන් කාලයක නොසැලී, අචලව රැඳී සිටීම සඳහා ඔබගේ බුද්ධියේ රේඛාව පැහැලිදිව තබා ගන්න. මේ සඳහා, කාලයට අනුව ඔබට හසුකර ගැනීමේ සහ ස්පර්ෂණ බල අවශ්‍ය වෙයි, එමෙන්ම මේවා වැඩි කර ගැනීමට, ඔබ ඒකායන කෙනාට අයත් වී අරපිරිමැස්මෙන් යුතු විය යුතුයි. ඒකායන කෙනාට අයත් අයට අරපිරිමැස්ම ඇති නිසා, ඔවුන්ට පැහැදිලි රේඛාවක් ඇති අතර පහසුවෙන් බාප්දාදාගේ උපදෙස් හසු කරගැනීමට හැකි වෙයි. ඕනෑම කැලඹිල්ලකදි වුනත් ඔවුන් නොසැලී අචලව රැඳී සිටියි.

**පාඨය:** දළ හෝ සියුම් ආශා සියල්ල අත්හරින්න, එවිට ඔබට ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට හැකි වෙයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

දැන්, ඔබේ මනසෙහි ගුණාත්මකභාවය වැඩි කරන්න, එවිට ගුණාත්මක ජීවාත්මයන් ඔබ වෙතට සමීප වනු ඇත. මේ මගින් ඔබට සහ අන් අයට ද්විත්ව සේවයක් සිදුවනු ඇත. ඔබට ඔබ වෙනුවෙන් වෙන වෙනම කිසිවක් කිරීමට සිදු නොවේ. තිළිණය ඔබට හිමිවීමේ මනෝ ස්ථිතිය ඔබ අත්විඳිනු ඇත. වර්තමාන කාලයේ ලැබෙන උසස් තිළිණය නම්: ‘‘සියලු ලැබීම් වලින් නිරන්තරයෙන් පිරී සිට අන් අයව පිරිපුන් කර වීමයි.’’